ශෝකය හා කම්පනය ඇතිකරවන සිදුවීමක් සම්බන්ධයෙන් කරුණු විමසීමේදී ජනමාධ්‍යවේදීන් නිසි සංවේදීතාවයෙන් හා සහකම්පනයෙන් යුතුව ක්‍රියා කළ යුතුයි. ප්‍රකාශයක් ලබාදෙන්නා මුහුණ පා සිටිනා කම්පනය මුලින්ම තක්සේරු කර සිටීමට මාධ්‍යවේදීන් ප්‍රවේසම් විය යුතුයි. ඔවුන් ප්‍රකාශයක් කිරීමට කැමැත්ත ලබාදිය හැකි මානසික තත්වයක නොසිටීමට හැකි අතර, එවන් විටක ඔවුන්ගේ කැමැත්ත ලබාගැනීමට උත්සාහ කිරීම හෝ ඒ සඳහා ඔවුන්ව මෙහෙයවීමට උත්සාහ නොකිරීම සුදුසු වේ. එය ජාත්‍යන්තර මාධ්‍ය ආචාර ධර්ම මගින්ද පෙන්වා දේ.

දඹුල්ල ප්‍රදේශයේ සිදුවූ ඝාතන-දිවි තොර කරගැනීමේ සිදුවීමක් සම්බන්ධයෙන්, එම මියගිය අයගේ පුතාගෙන් හිරු මාධ්‍යවේදියෙකු කරුණු විමසන ආකාරය, ඉහත පසුතලය යටතේ විමසා බැලිය හැක.
ඔබ සිතන ආකාරයට,

1) සිය දෙමාපියන් මිය ගොස් සිටින අවස්ථාවක, ඔහුගෙන් මෙවැනි ආකාරයේ ප්‍රශ්න ඇසීම යෝග්‍ය වන්නේ ද?

2) එය ප්‍රමාණවත් සහකම්පනයෙන් යුතුව කටයුතු කිරීමක් ලෙසින් දැකීමට හැකි ද?

ශෝකයට හා කම්පනයට ලක්ව සිටින්නන්ගෙන් කරුණු විමසීමේදී නිසි සහකම්පනයෙන් හා සංවේදී බවෙන් යුතුව කටයුතු කරමු!

මූලාශ්‍ර:
https://www.afp.com/.../12_april_2016_afp_ethic_final.pdf
https://accountablejournalism.org/.../Tanzania-Broadcasters
https://www.ipso.co.uk/reso.../deaths-and-inquests-guidance/